# මධ්‍යම පරිසර අධිකාරිය
## மத்திய சுற்றாடல் அதிகாரசபை
## Central Environmental Authority

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka . Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. } CEA/06/EPU/PR/39/2023

ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. }

දිනය / திகதி / Date } 2023.07.20

## මාධ්‍ය නිවේදනය

### ශ්‍රී ලංකාවේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට වැඩමුළුවක්...

ශ්‍රී ලංකාවේ පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීමේ අරමුණින් මධ්‍යම පරිසර අධිකාරිය සහ ඉන්දියාවේ නවදිල්ලියේ "සෙන්ටර් ෆො සයන්ස් ඇන්ඩ් එන්වයර්මන්ට්" නොහොත් "සීඑස්ඊ" ආයතනය (Center for Science and Environment - CSE) එක්ව වැඩමුළුවක් සංවිධාන කර තිබේ. මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන් වෙනුවෙන් පැවැත්වෙන මෙම වැඩමුළුව 2023 ජුලි මස 17 සහ 18 දෙදින කොළඹ දී පැවැත්වූ අතර 2023 ජුලි මස 20 සහ 21 දෙදින මහනුවරදී පැවැත්වීමට නියමිතය.

ජාතික පාරිසරික පනත යටතේ ශ්‍රී ලංකාවට ශක්තිමත් පාරිසරික නීතියක් තිබුණ ද එම නීති ක්‍රියාවට නැංවීමේදී විවිධ අභියෝගවලට මුහුණපෑමට සිදුව ඇති බව මධ්‍යම පරිසර අධිකාරියේ සහ සීඑස්ඊ ආයතනයේ අදහස වේ. ජාතික පාරිසරික පනත යටතේ ක්‍රියාත්මක පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය පරිසර සංරක්ෂණ ක්‍රියාවලියේදී ඉතා වැදගත් වන අතර නියමිත සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පරිසර බලපෑම් ඇගයීම් (EIA) ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට; දත්ත රැස්කිරීම, බලපෑම් තක්සේරු අධ්‍යයනය, පාරිසරික බලපෑම් තක්සේරු වාර්තා සකස් කිරීම සහ 'අනුකූලතා අධීක්ෂණය පහසු කිරීම සඳහා පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම' යන අදියරහිදී ඉතා ඕනෑකමින් සහ නිවැරදිව කටයුතු කළ යුතුය.

පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අවශ්‍ය පරිදි කටයුතු කිරීම මධ්‍යම පරිසර අධිකාරියේ, ව්‍යාපෘති යෝජකයින්ගේ මෙන්ම සියලු පාර්ශවකරුවන්ගේ වගකීමකි. යම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදීමේ දී පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවේ නිර්දේශ මත තීරණගනු ලබන බැවින් පරිසර බලපෑම් ඇගයීම් වාර්තාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවක් තිබේ. එබැවින් මධ්‍යම පරිසර අධිකාරිය සහ සීඑස්ඊ ආයතනය විසින් ශ්‍රී ලංකාව තුළ පාරිසරික බලපෑම් තක්සේරුව වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා එම ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ දැනුම වැඩිදියුණු කිරීමේ අපේක්ෂාවෙන් මෙම වැඩමුළුව සංවිධාන කරන ලදී.

පාරිසරික කළමනාකරණ සැලැස්ම සැකසීමේ දී පරිසර බලපෑම් හඳුනාගැනීම සහ පරිසර බලපෑම් ඇගයීම් වාර්තාව සමාලෝචනය යන අදියරහිදී ක්‍රියාකළ යුතු ආකාරය, මේ සම්බන්ධයෙන් වන ඉන්දියාවේ සිද්ධි අධ්‍යයනයන් ද ගෙනහැර දක්වමින් පැහැදිළි කිරීම වැඩමුළුවේදී සිදුකෙරිණ. පරිසර බලපෑම් ඇගයීම් වාර්තා ලිවීමේදී සහතිකලත් වෘත්තීයවේදීන් විසින්ම එය සිදුකිරීමේ ක්‍රමවේදය ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක

නොවන අතර එය සිදුකිරීමේ ඇති වැදගත්කම පිළිබඳව, සීඑස්ඊ (CSE) ආයතනයේ අධ්‍යක්ෂ නිවිට්කුමාර් යාදෙව් මහතා විසින් දේශනයක් පවත්වන ලදී.

"පරිසර බලපෑම් ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට ශක්තිමත් පරිසර නීතියක් තිබෙන බව ද එහෙත් අන්තර්ජාතික වශයෙන් මේ හා සබැඳිව ක්‍රියාත්මක කරනු ලබන ඇතැම් ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකාවේ ඇතැම් ක්‍රියාකාරකමක් පිළිබඳව යම් පරතරයක් පෙන්නුම් කරන අතර ඒ පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වන බව ද සීඑස්ඊ ආයතනයේ අධ්‍යක්ෂ නිවිට්කුමාර් යාදෙව් (Nivit Kumar Yadav) මහතා ප්‍රකාශ කළේය. ඒ අනුව නිසි දත්ත පද්ධතියක් පැවතීම, ගුණාත්මකභාවයකින් යුතු පරිසර බලපෑම් ඇගයීම් වාර්තා, පරිසර බලපෑම් ඇගයීම් වාර්තා සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් වන නියමිත ක්‍රමවේදයක් තිබීම, මහජන සහයෝගීත්වය වැඩිදියුණු කිරීම, මනාව සකස්කරන ලද පරිසර කළමනාකරණ සැලැස්මක් තිබීම, පසුවිපරම් කිරීම ඉතා වැදගත් වන බව පෙන්වාදුන් ඒ මහතා මෙම තත්වයන් ඇති කිරීම මගින් අදාළ ක්‍රියාවලිය තුළ විනිවිදභාවය ඇතිවනවාසේම කර්මාන්තකරුවන් ද මෙම ක්‍රියාවලියට නිරායාසයෙන්ම අනුගත කර ගැනීමට හැකි බව ද ප්‍රකාශ කළේය.

මෙම අවස්ථාවට සහභාගීවූ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සුපුන් එස්. පතිරගේ මහතා සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා මෙවැනි වැඩමුළුවක් පැවැත්වීමට දායකත්වය දැක්වීම පිළිබඳව සීඑස්ඊ ආයතනයට සිය කෘතඥතාව පළ කළ අතර පරිසර බලපෑම් ඇගයීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණ කාර්යයට සිදුවන පිටිවහල පිළිබඳ කරුණු දැක්විය.

2023 ජුලි මස 17 සහ 18 දෙදින කොළඹදී පැවති වැඩමුළුවේ සමාරම්භය මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සුපුන් එස් පතිරගේ මහතා සහ මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති අතර වැඩමුළුව පවත්වනු ලැබූයේ ඉන්දියානු කණ්ඩායමේ නියෝජිතයන් වන සීඑස්ඊ ආයතනයේ අධ්‍යක්ෂ නිවිට් කුමාර් යාදැවු (Nivit Kumar Yadav) මහතා, සීඑස්ඊ ආයතනයේ ආචාර්ය ඩී. ඩී. බාසු (D. D. Basu) මහතා, ඒඊඑස්පීඑල් (Aditya Environmental Services Pvt Ltd - AESPL) ආයතනයේ අධ්‍යක්ෂ රජීව් අවුන්ධෙ (Rajiv Aundhe) මහතා සහ මධ්‍යම පරිසර අධිකාරියේ පරිසර බලපෑම් ඇගයීම් ඒකකයේ අධ්‍යක්ෂිකා නිල්මිණී අත්තනායක මහත්මිය විසිනි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

සුපුන් එස්. පතිරගේ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය